© සියලු ම හිමිකම් ඇවිරිණි

අනු අංකයඃ ………………

# ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරින්ගේ සංගමය

## අන්තර්මධ්‍ය අදියර

## 2009 මාර්තු විභාගය

විභාග දිනය : 2009 අප්‍රේල් 05 පිටු ගණන : 02
විභාග වේලාව : පෙ.ව. 9.30 - ප.ව. 12.30 ප්‍රශ්න ගණන : 07

අයදුම්කරුවන්ට උපදෙස්ඃ

1. නියමිත කාලය පැය 3 කි.
2. ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.
3. පිළිතුරු සැපයිය යුත්තේ සිංහල භාෂාවෙන් පමණි.

| විෂය | විෂය සංකේතය |
|---|---|
| ව්‍යාපාර හා සමාගම් නීතිය | (BCL / 604) |

**ප්‍රශ්න අංක 01** *(ලකුණු 20)*

(a) (i) සමාගමක ගණකාධිකාරී තනතුර සඳහා පෙරේරා අයදුම් කළේ ය. සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලදුව ඔහු පත්කිරීමට සමාගම විසින් යෝජනාවක් සම්මත කරගන්නා ලදී. එහෙත් ඒබ ව ඔහුට දැන්වීමට සමාගමට කටයුතු කිසිවක කිරීමට නොහැකි විය. කෙසේ වෙතත් අධ්‍යක්ෂවරයෙකු වන සිල්වා අධිකාරීත්වයකින් තොරව පෙරේරා පත්කරගෙන ඇති බව ඔහුට දැන්වීය. පසුව සමාගම කලින් යෝජනාව අලංගු කර වෙනත් අයදුම්කරුවෙකු පත්කර ගැනීමට යෝජනා කරගන්නා ලදී. ගිවිසුම උල්ලංඝනය කිරීමට එරෙහිව සමාගමට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙරේරා අදහස් කරයි.

ගිවිසුම උල්ලංඝනය කිරීමට එරෙහිව සමාගමට විරුද්ධව පෙරේරාට නීතිමය ක්‍රියාමාර්ගයක් ගත හැකි ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 05)

(ii) අරුන් ඔහුගේ ඉඩමට යාබදව පිහිටි ''පොල්වත්ත'' යන ඉඩම මිල දී ගැනීමට අදහස් කරයි. ''පොල්වත්ත'' මට විකිණීමට ඔබ කැමති ද? අවම මිල සඳහන් කරමින් විදුලි පුවතක් එවන ලෙස දන්වා පොල්වත්තේ අයිතිකරු වන මහේෂ්ට අරුන් විදුලි පුවතක් යැවීය. පොල්වත්තේ අවම මිල රු.900,000/- ක් බව දන්වා මහේෂ් අරුන්ට විදුලි පුවතක් එවීය. ඔබ සඳහන් කළ පරිදි පොල්වත්ත රු.900,000/- කට මිල දී ගැනීමට මම කැමැත්තෙමි යන්න සඳහන් කර අරුන් මහේෂ්ට විදුලි පුවතක් යැවීය. එවිට පොල්වත්ත රු.900,000/- කට විකිණීමට කැමැති නැති බව මහේෂ් තීරණය කළේ ය.

ගිවිසුම උල්ලංඝනය කිරීමට එරෙහිව නඩු පැවරීමට අදහස් කරන අරුන්ට උපදෙස් දෙන්න. (ලකුණු 05)

(b) වලංගු ගිවිසුමක් සකස් කිරීමේ දී අවශ්‍ය වන අංග සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 10)
(මුළු ලකුණු 20)

**ප්‍රශ්න අංක 02** *(ලකුණු 20)*

(a) 2007 අංක 7 දරණ සමාගම් පණත යටතේ සමාගමක් ලියාපදිංචි කිරීමේ දී රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු සමාගම් ගාස්තු පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කරන්න. (ලකුණු 11)

(b) පහත සඳහන් ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

(i) පෞද්ගලික සමාගම්

(ii) පොදු සමාගම්

(iii) අක්වෙරළ සමාගම් (ලකුණු 09)

(මුළු ලකුණු 20)

**<u>ප්‍රශ්න අංක 03</u>** *<u>(ලකුණු 20)</u>*

සාංගමික ව්‍යවස්ථාවලියේ ස්වභාවය හා බලපෑම පැහැදිලි කරන්න. (මුළු ලකුණු 20)

**<u>ප්‍රශ්න අංක 04</u>** *<u>(ලකුණු 20)</u>*

(a) විනිමය බිලක පාර්ශව ගැන කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(b) බිලක ආදායකයා වන කාරා එහි හිස් පිටසනක් යොදා බාලාට බාර දෙයි. බාලා එම බිල ගෙවීම සඳහා ඉදිරිපත් කළ විට ප්‍රතිග්‍රාහකයා බිල අගරු කර ඇත.

ඔහුගේ බිල ගැන ඇති වගකීම් පිළිබඳව කාරාට උපදෙස් දෙන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 20)

**<u>ප්‍රශ්න අංක 05</u>** *<u>(ලකුණු 20)</u>*

සමාගමක අධ්‍යක්ෂවරයෙකු පත් කළ හැකි ආකාරය හා තනතුරෙන් ඉවත් කළ හැකි ආකාරය පැහැදිලි කරන්න. (මුළු ලකුණු 20)

**<u>ප්‍රශ්න අංක 06</u>** *<u>(ලකුණු 20)</u>*

(a) පාලන පරීක්ෂාව (Control Test) අනුව ස්වාමි හා සේවක සම්බන්ධතාවය ඇති කිරීමේ දී සැළකිල්ලට භාජනය කෙරෙන තීරක සාදක පැහැදිලි කරන්න. (ලකුණු 10)

(b) භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් යන්න (Contract of sale of goods) නිර්වචනය කර එහි අඩංගු වැදගත්ම අංග නම් කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 20)

**<u>ප්‍රශ්න අංක 07</u>** *<u>(ලකුණු 20)</u>*

(a) නියෝජිතයෙකුගේ යුතුකම් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 12)

(b) ආපන ශාලාවක අයිතිකරුවකු වන ප්‍රභාත් ව්‍යාපාර කටයුතු කරගෙන යෑම සඳහා කළමනාකරු වශයෙන් බිමල් පත් කළේ ය. දෙදෙනා අතර ඇති කරගත් ගිවිසුම අනුව ව්‍යාපාරයට බියර් මිල දී ගැනීම බිමල්ට තහනම් ය. කෙසේ වෙතත් බිමල් විසින් ආපන ශාලාවේ ප්‍රයෝජනය සඳහා හොට් ඩිස්ටලිරීස් (Hot Distilleries) වෙතින් බියර් මිලට ගෙන ඇත.

බියර්වල වටිනාකම වෙනුවෙන් හොට් ඩිස්ටලිරීස් (Hot Distilleries) ආයතනයට ප්‍රභාත්ට විරුද්ධව නඩු පැවරිය හැකි ද යන්න සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(මුළු ලකුණු 20)

***ප්‍රශ්න පත්‍රය අවසානයි***